ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය
කොළඹ

පුවත්පත් නිවේදනය

**<u>MV එක්ස්ප්‍රස් පර්ල් නෞකාවේ ගින්න මැඩපැවැත්වීමට ඉන්දීය සහය</u>**

ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් කරන ලද හදිසි ඉල්ලීමකට කඩිනම් ප්‍රතිචාර දක්වමින්, කොළඹට ඔබ්බෙන් නැංගුරම් ලා තිබෙන **MV එක්ස්ප්‍රස් පර්ල් නෞකාවේ ගින්න නිවීම සඳහා ඉන්දියාව** 2021 මැයි 25 වන දින විවිධ අධාර පිටත් කර එවීය. ගුවන් මගින් නිරීක්ෂණ කටයුතු කිරීම සඳහා එවන ලද ඩෝනියර් ගුවන් යානයට අමතරව ඉන්දීය වෙරළාරක්ෂක බලකාය විසින් එවන ලද වෛභව්, වජ්‍රා සහ සමුද්‍ර ප්‍රෙහාරි යන නෞකාවන් සහ නාවික කටයුතු පිළිබඳ අධ්‍යක්ෂ ජෙනරාල් විසින් එවන ලද වෝටර් ලිලි බෝට්ටුව ද මෙයට ඇතුළත් විය.

2. ගින්න මැඩපැවැත්වීමට සහ පරිසර හානිය පාලනය කිරීම සඳහා 2021 මැයි 25 වන දින මධ්‍යහන 12ට ශ්‍රී ලංකා නාවික හමුදාව ඉන්දීය රජයේ සහය ඉල්ලා සිටින ලදී. 2021 මැයි 25 වන දින සිංගප්පූරුවේ MV එක්ස්ප්‍රස් පර්ල් නෞකාවේ ඇති වූ පිපිරුමකින් අනතුරුව මෙම ඉල්ලීම සිදු කෙරිණ. මෙම ඉල්ලීමට ක්ෂණිකව ප්‍රතිචාර දක්වමින් ඉන්දියාවේ අදාළ බලධාරීන් දැනුවත් කෙරුණු අතර අවශ්‍ය කෙරෙන සහය කඩිනමින් පිටත් කර එවන ලදී. ඩෝනියර් ගුවන් යානය 2021 මැයි 25 වන දින පස්වරු 4ට කොළඹට ළඟා වූ අතර පළමු නෞකාව පස්වරු 7ට පමණ කොළඹට ළඟා වනු ඇත.

3. ඉන්දියාව සැමවිටම ශ්‍රී ලංකාව මුහුණ දෙන අර්බුදකාරී තත්ත්වයන් හිදී ප්‍රථමයෙන්ම ප්‍රතිචාර දක්වයි. 2020 සැප්තැම්බර් මාසයේදී බොරතෙල් මෙට්‍රික් ටොන් 200,000ක් සමඟින් ශ්‍රී ලංකාවේ නැගෙනහිර වෙරළාට ඔබ්බෙන් ගිනිගැනීමට ලක්වූ MT නිව් ඩයමන්ඩ් නෞකාව හේතුවෙන් ඇතිවිය හැකිව තිබූ විශාල තෙල් කාන්දුවක් ඉන්දියාවේ සහය ඇතිව වළක්වාලන ලදී. 2017 මැයි මාසයේදී ශ්‍රී ලංකාවේ ඇති වූ ගංවතුර තත්ත්වයේදී ද ඉන්දීය නෞකා 3ක් කඩිනමින් ශ්‍රී ලංකාවට ළඟා විය.

* * * * *

කොළඹ
2021 මැයි 25